# පිළිකුත්තුව රජමහා විහාරයේ සිතුවම්, සෙල්ලිපි හා ආවාස සම්ප්‍රදාය පිළිබඳ අධ්‍යයනයක්

එච්.ඒ.සචිත්‍රා නිර්මාණි ජයරත්න, කේ.කේ.එච්.එම්. ගුණවර්ධන*

බස්නාහිර පළාත, ගම්පහ දිස්ත්‍රික්කයට අයත් සියනෑ කෝරළයේ, උරුවල් පේරුවෙහි පිහිටා ඇති පිළිකුත්තුව රජමහා විහාරය පැරණි ලෙන් විහාර සම්ප්‍රදායට අයත් විහාරයක් වේ. විහාරයේ ඇති ලෙන් සංකීර්ණය ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බව එහි ශේෂව ඇති පුරාවස්තු පරීක්ෂා කිරීමෙන් අනතුරුව තහවුරු කර ඇත. මහනුවර යුගයේ දක්නට ලැබෙන ශෛලිගත චිත්‍ර සම්ප්‍රදායෙන් මදක් බාහිර වූ චිත්‍ර ශෛලියක් මෙම විහාරස්ථානයේ දැකගත හැකිය. එසේම 15 ශතවර්ෂයේ (පෘතුගීසි යුගය) මෙම ප්‍රදේශයේ පැවති ජන ජීවිතය මෙම චිත්‍ර මඟින් මැනවින් පිළිබිඹු කර ඇත. එමෙන්ම මෙම විහාරස්ථානයේ ඇති තවත් සුවිශේෂත්වයක් ලෙස ක්‍රි.පූ 3 වන සියවසට අයත් බ්‍රාහ්මීය අක්ෂර සහිත සෙල්ලිපිය පෙන්වා දිය හැකිය. පිළිකුත්තුව විහාරස්ථානයේ ආවාස පිළිබඳ අධ්‍යයනයේ දී කාලපරිච්ඡේදය ඕලන්ද, ඉංග්‍රීසි, මහනුවර යනාදී ලෙස යුග තුනකට අයත් ලක්ෂණ සහිත ආවාස දැකගත හැකිය. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ පිළිකුත්තුව රජමහා විහාරය් සිතුවම් , සෙල්ලිපි හා ආවාස පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මූලික වශයෙන් මෙම අධ්‍යයනය සඳහා තොරතුරු රැස්කිරීම සාහිත්‍ය මූලාශ්‍ර සහ ක්ෂේත්‍රයට ගොස් දත්ත වාර්තා කරන ලදී. ක්ෂේත්‍රය තුළ දත්ත රැස් කිරීමේදී විහාරාධිපති ස්වාමීන්වහන්සේගේ සහ ප්‍රදේශවාසීන්ගේ සහය ලබා ගන්නා ලදී. පිළිකුත්තුව රජමහා විහාරය යුග කීපයක් නිරූපණය කරන බව පෙනී යයි. පාසල් ශිෂ්‍යයන්ට මෙන්ම විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන්ට , පුරාවිද්‍යාඥයින්ට අධ්‍යයන කාර්යයන් සඳහා එනම් එකම ස්ථානයකින් යුග කිහිපයක දැනුම ලබා ගැනීමට හැකිවීම මෙම විහාරස්ථානයේ ඇති විශේෂත්වයයි.

මුඛ්‍ය පද :- පිළිකුත්තුව රජමහාවිහාරය, සිතුවම් , සෙල්ලිපි, ආවාස

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය nirmanijayarathna321@gmail.com / hasigunawardana@yahoo.com